# ඩබ්ලිව්.පී.එම්. ප්‍රනාන්දු එ. රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 262 /2018 (2018.07.12 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඩබ්ලිව්.පී.එම්. ප්‍රනාන්දු
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

**පෙනීසිටීම**
අභියාචක - **පෙනී නොසිටින ලදි**
පොදු අධිකාරිය - පෙනී නොසිටින ලදි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2017.05.18 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2017.05.22 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017.09.08 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.03.14 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2017.05.18 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

*2015 වසරේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේශ පන්තියට උසස් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරී (යටිතල) හා අතිරේක ලේකම් (කාර්මික) ප්‍රවාහන අමාත්‍යංශයේ තනතුරු සඳහා අයදුම්කරුවන් ලබාගත් ලකුණු.*

තොරතුරු නිලධාරිය 2017.05.22 දිනැතිව ප්‍රතිචාර දක්වමින් සඳහන් කර සිටින ලද්දේ අදාළ තොරතුරු ලබාදීම පනතේ 5 වන වගන්තියේ ව්‍යතිරේක අනුව ප්‍රතික්ෂේප කරන බවයි. මින් අතෘප්තියට පත් අභියාචක විසින් 2017.09.08 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකළ අතර නම්කළ නිලධාරියා පනතේ සඳහන් නියමිත කාල පරාසය තුළ කටයුතු කිරීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2018.03.14 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා පොදු අධිකාරිය පැමිණ නැති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

2018.06.19 දිනැතිව පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට ලිඛිතව දන්වා එවා ඇත්තේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු අංක PSC/EST/06-08/03/2017 හා 2018.05.03 දිනැති ලිපිය මඟින් යොමුකර ඇති බවත් එහි පිටපතක් කොමිෂන් සභාවේ අවධානය සඳහා මේ සමඟ අමුණා ඇති බවත්ය. ඒ අනුව 10 ආකෘති පත්‍රයට අනුව මාගේ PSC/EST/06-08/05/2017 හා 2018.05.31 දිනැති ලිපියෙන් තොරතුරු ලබා දී ඇති බවත් එහි පිටපතක් මීට අමුණා ඇති බවත්ය.

මෙම කරුණු දැක්වීම මත කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ අභියාචක විසින් විමසා ඇති තොරතුරු, පොදු අධිකාරිය විසින් මේ වන විටත් ලබා දී ඇති බවය.

**නියෝගය:**

අභියාචක විසින් විමසා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් ලබාදීම මත අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****